# නර්තනය - 9 ශ්‍රේණිය

**(පළමු වාරය )**



The National e-learning Portal for the General Education

# පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත ඇසුරින් නර්තන නිර්මාණය

* අප අවට පරිසරයේ දක්නට ලැබෙන විවිධ චරිත ප්‍රභේද අතුරින් මනුෂ්‍ය චරිත විශේෂ වේ. ඒවායේ එකිනෙකට වෙනස් චරිත ලක්‍ෂණ රැසක් හඳුනාගත හැකිය.

* ඔබට එදිනෙදා ජීවිතයේ දී හමුවන මිනිසුන් පිළිබඳ මතකය අවධි කරන්න.

* විවිධ වයස් මට්ටම් වල අය ඔබේ මතකයට නැගෙනු ඇත.

උදා:- ළමයින් | තරුණයින් | මහලු පුද්ගලයින්





* විවිධ ගතිගුණ ඇති පුද්ගලයින් ඔබේ මතකයට නැගෙනු ඇත.

උදා :- දුර්වලයින් — ප්‍රබලයින්

නිවටයින් — වගේම — තේජාන්විතයින්

පරාජිතයින් — වීරයින්

* එසේම කාන්තාවන්  පිරිමින් 

* මේ ආදී අසමාන ලක්‍ෂණ ඇති බොහෝ මිනිස් චරිත ඔබේ මතකයට නැගෙනු ඇත.

මේ සෑම චරිතයකටම

→ බාහිරින් ප්‍රකාශ වන ලක්‍ෂණ ඇත.

→ අභ්‍යන්තරික ගතිස්වභාව ඇත.

**මිනිස් චරිත නර්තන නිර්මාණයට ගැනීමේදී බාහිරින් ප්‍රකාශවන ලක්‍ෂණ වලට මුල්තැන ලබාදෙයි.**

↓

එබැවින් නිර්මාණය කරන චරිතය නිරීක්‍ෂණය කිරීම ඉතාම වැදගත් වේ.

↓

නිරීක්ෂණය කළ යුත්තේ

- ගමන් විලාස හා බැඳි විවිධතා
- අංග, ප්‍රත්‍යාංග උපාංග ආදියේ ක්‍රියාකාරිත්වය
- භාව ප්‍රකාශනය

* ඉහත කරුණු සියල්ලම සැලකිල්ලට ගනිමින් අපට නර්තන නිර්මාණය සඳහා විවිධ මිනිස් චරිත තෝරාගත හැකිය.

ධීවරයා



කුඹල්කරු



ගොවියා



තේ දළු නෙලන්නිය



**ක්‍රියාකාරකම - I**

* චරිත ලක්ෂණ සැලකිල්ලට ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| **චරිතය** | **ඇඳුම් පැළඳුම්** | **භාවිතා කරන උපකරණ** | **හැසිරීම් රටාව** |
|---|---|---|---|
| ධීවරයා | | | ඔරුව පැදීම, දැල් ඇදීම |
| කුඹල්කරු | | | |
| ගොවියා | | | |
| තේ දළු නෙලන්නිය | | | |

* ඉහත ක්‍රියාකාරකම දෙස බැලීමේදී අපිට හඳුනාගත හැක්කේ එක් එක් චරිත සඳහා ඒවාට ආවේණික ලක්ෂණ ඇති බවයි.

## <u>චරිත නිරූපණය සඳහා අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත්</u>

* පරිසර නිරීක්ෂණයේදී ලබන අත්දැකීම් ඇසුරු කර ගැනීම.
* විවිධ ජීවන වෘත්තීන් පිළිබඳ ස්වභාවය අවධාරණය කිරීම.
* නර්තනය මාධ්‍යය කොටගෙන චරිත නිරූපණය කිරීම.
* තාලය, රිද්මය හා ප්‍රකාශනය කෙරෙහි අවධානය යොමු කිරීම.
* භාවමය හැඟීම් උද්දීපනය වන සේ නර්තන නිර්මාණය.
* චලන හා අවකාශ භාවිතය පිළිබඳ අවබෝධය.
* බෙර වාදනය හා සංගීතය උපයෝගී කරගැනීම.

# චරිත නිර්මාණයට සුදුසු සිද්ධියක් ගොඩ නැගීම.

* ධීවරයාගේ චරිතය ගොඩනගමු.

ධීවරයකුගේ චරිතය ගොඩ නැගීමේදී පහත පියවර අනුව නර්තන නිර්මාණය කරගැනීමෙන් වඩාත් ආකර්ශනීය නිර්මාණයක් සිදුකර ගැනීමට හැකිය.

ආගම ඇදහීමෙන් පසු වෙරළට ගොස් ඔරුව දියත් කිරීමට

↓

හබල් ගසා ඔරුව දියබට ගෙනයාම

↓

දැල් රැගෙන ඈතට එළීම

↓

ඒවා ආපසු ඇද මතස්‍යය සම්පත ලබාගැනීම

↓

නැවත ඔරුව ගොඩට ගෙනඒම

↓

නැවත වෙරළේ විශාල දැලක් අදින කණ්ඩායමට එක්වීම

↓

ලැබූ සරු මතස්‍ය අස්වැන්න නිසා සතුටු වීම

↓

ඉහත පියවර අනුගමනය කරමින් ධීවරයාගේ චරිතය නිර්මාණය කිරීම සඳහා යොමුවිය හැකිය.

**ක්‍රියාකාරකම** - II

කුඹල්කරු, ගොවියා, තේ දළු නෙලන්නිය යන චරිත අතරින් ඔබේ වඩාත්ම සිත්ගත් චරිතය තෝරාගෙන එයට අදාල සිද්ධිය පියවර වශයෙන් පෙළගස්වන්න. ඒ සඳහා නර්තන නිර්මාණයක් ද කරන්න.